

# වලස් පැංචා



ආර්.එම්.සෙනුරි තත්සරණි රත්නායක

කෘතියේ නම :- වලස් පැංචා

කතෘගේ නම :- ආර්.එම්.සෙනුරි තත්සරණි රත්නායක

කතෘ අයිතිය ඇතුළු විස්තර :- 978-624-211-199-5

කතෘගේ වෙනත් කෘති :- නරි රාළට පාඩමක්

හිත හොඳ ඇත්

මී වද තිත්ත වූ වලස් පැංචා

ළමයා සහ කතා කරන බෝනික්කා

පාසල :- මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ඉගෙනුම ලබන පංතිය :- 8 ශ්‍රේණිය

කෘතිය පළ කරන දිනය :- 2026/05/10

# පිදුම

මෙම පොත සෑදීමට මා හට

නිරන්තරයෙන් ශක්තියක් වූ

මාගේ දෙමාපියන්ටත්,

සහෝදර සහෝදරියන්ටත්,

පන්තිභාර ගුරු මෑණියන්ටත්,

උපදෙස් ලබාදුන්

සෙනෙවිරත්න සර්ටත්

මෙම පොත

ගෞරවයෙන් පුදමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් පුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


එකෝමත් එක කාලෙක
සත්තු ගොඩක් ඉන්න ලොකු කැලෑවක් තිබුණා.
මේ කැලෑවේ සත්තු එකමුතුයි
වගේම සතුටින් ජීවත් වුණා.
ඉතින් මේ කැලෑවේ, පුංචි කැලෑ පාසලක් තිබුණා.
මෙයට කැලෑ සතුන් ගොඩක් සහභාගී වෙනවා.



මේ කැලෑවේ, එක ගල් ගුහාවක
වලස් පවුලක් ජීවත් වුණා.
මේ දෙන්නට පුංචි කඩයක් තිබුණා.
මේ දෙන්නා ජීවත් වුණේ මේ කඩයේ බඩු විකුණාලා ලැබෙන දේවල්
වලින් නිසා මෙයාලගේ හැමදේම වුනේ මේ කඩය තමයි.


ඒත් මෙයාලට ඒ දේවල් වලින් ජීවත් වෙන්න අමාරුයි. හැබැයි මෙයාලා ඒක කොහොමහරි පිරිමහගන්නවා.

ඔහොම ටික කාලයක් යනකොට වලස් හාමුට, මී පැණි කර්මාන්තශාලාවක, රස්සාවක් හමුවුණා. ඒ නිසා, වලස්හාමු ගොඩක් සතුටින් හිටියේ.



ඒ වගේම වලස් හාමිත් වලස් හාමුට, මී පැණි කර්මාන්තශාලාවක රස්සාවක් හම්බවුණාට වලස්හාමි එයාලගේ පුංචි කඩය ඉදිරියටම කරගෙන ගියා. මොකද, කැලෑවේ සතුන්ට, කෑම බීම ගන්න තියෙන්නේ, මේ කඩය විතරක් නිසා. මේ නිසා මෙයාලට කෑම වලින් අඩුවක් තිබුණා නැහැ.

ටික කාලයකින්, මේ දෙන්නාට, වලස් පැටියෙක් හම්බවුණා.
මෙයාගේ නම පැංචා.
පැංචාට, ආදරේට වලස් පැංචා කියලත් කියනවා.
ඉතින් මේ පැංචාගේ හුරතල් වැඩ නිසා වලස් අම්මාටයි වලස් තාත්තටයි කාලය ගෙවනවා දැනුනේ නැහැ.



ටික කාලයක් යනකොට, වලස් අම්මයි, තාත්තයි, වලස් පැංචාව, කැලෑ පාසලට යවන්න තීරණය කළා.
මොකද පැංචා දැන් ටිකක් ලොකුයි.
පැංචාත් ආසාවෙන් හිටියේ පාසල් යන්න.
ඔන්න ඉතින් පාසල් යන දවස උදාවුණා.

පැංචා, උදෙන්ම අවදිවෙලා පාසල් යන්න ලෑස්ති වුණා.

වලස් තාත්තත්, වැඩට යන්න ලෑස්ති වුණා.

වලස් අම්මත්, උදෙන්ම නැගිටලා.

කෑම හදලා, වලස් පැංචාටයි වලස් තාත්තාටයි දුන්නා.

වලස් තාත්තා සමග, වලස් පැංචා

පාසල් යන්න ගෙදරින් පිටත් වුණා.



වලස් තාත්තා, පැංචාව කැලෑ පාසලේ ගුරුතුමාට බාර දී

වැඩට යන්න පිටත් වුණා.

කැලෑ පාසලේ ගුරුතුමා තමයි ඉබ්රාල.

ඉබ්රාල, පැංචාව සතුටින් භාරගත්තා.

එදා පැංචාට, ගොඩක් යාළුවෝ හම්බවුණා.

ඉබ්රාල පාසලේ පළමු දවසේදී තමා පිළිබඳව හැඳින්වීම ද,

ළමයි පිළිබඳ හැඳින්වීම ද සිදු කළේය.

ඉන් පසු, ඉබ්රාල කැලෑ ළමයිට විවිධ ක්‍රියාකාරකම් සිදු කළේය.
විවේක කාලයේදී, මොවුන් සෙල්ලම් කර කෑම කෑවා.

ඉන්පසු, පාසල නිම වූයේය. කැලෑ ළමයින්ගේ දෙමව්පියන්
පැමිණ කැලෑ ළමයි ගෙදර රැගෙන ගියා.

වලස් පැංචාගේ අම්මා, පැංචාව ගෙදර රැගෙන ගියා.

පැංචා, ගෙදර ඇවිත් අලුත් ඉස්කෝලේ විස්තර අම්මාට කිව්වා.
වලස් අම්මා, පැංචාට කෑම කන්න දුන්නා.



ටික වෙලාවකින්, වලස් තාත්තා, ගෙදර ආවා.
පැංචා, තාත්තා ළඟට ආවා. තාත්තා, පැංචාව වඩා ගත්තා.
වලස් තාත්තා, පැංචා ආසම මී පැණි ගෙනත් තිබුණා.
පැංචාට, ගොඩක් සතුටුයි. වලස් අම්මා, මී පැණි අරන් තිබ්බා.
පැංචා මුහුණ සෝදලා ඇඳුම් මාරු කරලා නිදා ගත්තා.


මෙලෙස දින ගණන් ගෙවී ගියා. එක් දිනක උදෑසන පැංචා වෙනදා මෙන් පාසල් ගියා. එදින ගුරුතුමා ඔවුන්ට ''තමා සතු දක්ෂතාව පෙන්විය යුතුයි. ඒ සඳහා සතියක කාලයක් දෙනවා'' කියලා තිබුණා. ඉතිං පැංචා, මේ ගැන හිත හිතා ගෙදර ගියා. කැලෑ ළමයින්ට කාලය ගෙවනවා දැනුනේ නැහැ. ඔන්න ඉතින් ඒ දවස උදාවුණා. කැලෑ ළමයි, විවිධ ඇඳුම් නිර්මාණ විවිධ විවිධ බඩු අරගෙන ඇවිත් තිබුණා.



ඉබ්රාල, ළමයින්ගේ දක්ෂතා බලන්න ආසාවෙන් හිටියේ. ඔන්න ඉතින් දැන් ඒ වෙලාව ආවා. පළවෙනියට හිටියේ, හා පැංචා. හා පැංචාගේ, දක්ෂතාවය තමයි විවිධ වර්ගයේ අත් නිර්මාණ සිදුකිරීම. හා පැංචා, ලස්සන අත් නිර්මාණ හැදුවා. ගුරුතුමා ඒවා අගය කළා. දෙවනියට ඉත්තෑ පුංචා. ඉත්තෑ පුංචාට, විවිධ මෝස්තරයේ ඇඳුම් මහන්න පුළුවන්. එයා එයාගේ කටු භාවිතා කරලා තමයි මහන්නේ. තුන්වෙනියට, සුදු ඌරු පැංචා. සුදු ඌරු පැංචාට, ලස්සන විවිධාකාරයේ චිත්‍ර අඳින්න පුළුවන් ඒවා හරිම ලස්සනයි.


ඔය විදිහට, තව ගොඩක් අය විවිධ හැකියා පෙන්නුවා.
අන්තිමට වලස් පැංචා. වලස් පැංචා ,අනිත් හැමෝටම වඩා විශේෂ දෙයක් තමා කරලා පෙන්නුවේ.
ඔයාලා දන්නවද ඒ මොකක්ද කියලා?
ඒ තමයි සර්කස්. එයා සර්කස් තනියම තමයි ඉගෙන ගෙන තියෙන්නේ.
පැංචා, ලස්සන සර්කස් සංදර්ශනයක් පැංචාගේ ගුරුතුමාටයි යාළුවොන්ටයි පෙන්නුවා.

යාළුවොයි, ඉබ්රාලයි, අත්පොළසන් දී එය අගය කළා.
පැංචාට ගොඩක් සතුටුයි.



පාසල අවසන් වී, පැංචා, ගෙදර ගියා. රෑ බෝවුණා.
පැංචාගේ තාත්තා, ගෙදර ආවා.
රෑ කෑම මේසයේ දී, පැංචා,
පාසලේ සිදුවූ සියලු දේ අම්මාටයි, තාත්තාටයි කිව්වා.
ඒ දෙන්නත්, පැංචා වගේ කලා.

තවත් අලුත් දවසක් උදාවුණා. ඉතින් පැංචයි, පැංචාගේ යාළුවෝ ටිකයි, එකතු වෙලා සෙල්ලම් ගෙදරක් හැදුවා. නමකුත් දැම්මා. 'කැලෑ පැංචලාගේ සෙල්ලම් ගේ' කියලා. මේක ලී වලින් තමයි හදලා තියෙන්නේ.




මෙයාලා, නිවාඩු දවස්වලටයි, ඉස්කෝල ඉවර වෙලයි, සෙල්ලම් ගෙදරට සෙල්ලම් කරන්න එනවා.

ඉතින් එක දවසක් රෑ, තද සුළඟක් එක්ක මොර සූරන වැස්සක් වැස්සා. කැලෑ ළමයි හැමෝම බයවෙලා හිටියේ, සෙල්ලම් ගෙදරට කරදරයක් වෙයි කියලා. උදේ පාන්දරම මෙයාලා හැමෝම ඇවිත් බැලුවා. හිතුවා වගේම සෙල්ලං ගෙදර කැඩිලා. මෙයාලා දුක් උනා.



කැලෑ ළමයිගේ, දෙමව්පියෝ, එතැනට ආවා. මෙයාලා, හැමෝම එකතුවෙලා සෙල්ලම් ගෙදර තිබුණටත් වඩා ලස්සනට හැදුවා.

කැලෑ ළමයිට, ගොඩක් සතුටුයි.

මෙයාලා, සතුටින් ගෙවල් වලට ගියා.

ටික දවසකින්, මෙයාලාව ඉබ්රාල පීනන විදිහ කියලා දෙන්න,
ගඟ ළඟට අරගෙන ගියා. ටික වෙලාවකින්,
ඌරු පැංචා කාටවත් නොකියා,
''මට පුළුවන් පීනන්න මං පෙන්නන්නම් කෝ'' කියලා,
ගඟ පහළට ගියා.

ඊට පස්සේ ඌරු පැංචා, ගඟට පැන්නා. ටික වෙලාවකින්,
''අනේ මාව බේරගන්න'' කියලා ශබ්දයක් ඇසුණා.
ඉබ්රාලයි, ළමයි ඒ පැත්තට දිව්වා.
ඌරු පැංචා, ගඟ දිගේ පහළට ගහගෙන යනවා.
පැංචාට, මේක බලාගෙන ඉන්න බැහැ.
ඉසරාල, විසඳුමක් දෙන්නත් කලින්, පැංචා, ළඟ තිබුණු ලී කොටයක්
අරගෙන, වතුරට පැන්නා.



පැංචා, ඉක්මනින් පිහිනා ගොස් ඌරු පැංචාව, බේරා ගත්තා.
දෙන්නම ගොඩට ආවා. ඉබ්රාලට, සතුටුයි වගේම පුදුමයි.
පුදුම ඇයි දන්නවද පැංචා කොහොමද පීනුවෙ කියලා.
පැංචාගේ උත්තරේ තමයි,
''මගේ තාත්තා, මට පුංචි කාලේ පීනන්න කියල දීල තියෙනවා''
කියන එක. ඉතින් හැමෝම, මෙයාට ප්‍රශංසා කළා.



ඌරු පැංචා, පැංචාට ස්තුති කළා වගේම, ඉබ්රාලගෙන් සමාව ඉල්ලුවා. ඉබ්රාල, සමාව දී අවවාද කළා. ඉතිං යාළුවනේ, ඔයාලට තේරෙනවනේ,

මේ කතාවෙන් ඔයාලට ජීවිතේට ගන්න තියෙන ආදර්ශය මොනවද කියලා. ඒවා, නිවැරදි ලෙස ජීවිත වලට අරගෙන, හොඳ ළමයෙක් වෙන්න, පුරුදු වෙන්න. ඒ වගේම දෙමව්පියන්ගේ, අවවාද පිළිගෙන, කටයුතු කිරීම වටිනා බව තේරුම් ගන්න.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)